චක්‍රලේඛ අංක:- **1 / 2017**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත,

**<u>මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන/පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාරවේල ලබාදීමේ වැඩසටහන 2017</u>**

පෙර පාසල් වියේ දරුවන්ගේ පෝෂණ තත්වය ඉහල නැංවීමේ අරමුණින් මෙතෙක් දියත්කල කිරි වීදුරුව වැඩසටහන වෙනුවට පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාර වේලක් ලබාදීමේ ජාතික වැඩසටහන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන කේන්ද්‍ර කරගනිමින් 2017 වර්ෂයේදී පහත සඳහන් ආහාර සැලැස්මට අනුව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

**<u>වගුව 1</u>**

| සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා |
|---|---|---|---|---|
| බත්, පරිප්පු,කොළ මැල්ලුම, වියළි හාල්මැස්සන් ව්‍යාංජනයක් | ධාන්‍ය වර්ගයක් (පොල් සමග ) උදා : කව්පි,කඩල,මුං ඇට | මුං කිරි බත් ( ලුණු මිරිස් සමග) මාළු කෑල්ලක් (කුඩා ප්‍රමාණයේ) | එළවළු මිශ්‍ර නූඩ්ල්ස් (බිත්තරයක් සමග) | බත් (එළවළු හා බිත්තර මිශ්‍රකර), සෝයා මීට්/පරිප්පු ව්‍යාංජනය. |

උදෑසන ආහාරවේල ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පෙර පාසල ලියාපදිංචි වී තිබීම අනිවාර්ය නොවන අතර මෙම ආහාරවේල උදෑසන 10.00 ට පෙර ලබාදී අවසන් කිරීම සඳහා කටයුතු කළයුතුය.

**02.** පෙර පාසල් වියේ පසුවන අඩුබර සහිත දරුවන්ගේ පෝෂණ තත්ත්වය නංවාලීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වන අතර සෞඛ්‍ය අමාත්‍යාංශයේ 2015 වර්ෂයේ පෝෂණ මාසයේ දත්ත වලට අනුව අඩු බර සහිත දරුවන් වැඩි ප්‍රතිශතයක් වාසය කරන ප්‍රාදේශිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයන්හි (ඇමුණුම 01) ( එම කොට්ඨාශ තුල පවතින පෝෂණ ඌනතා සහිත ප්‍රදේශ "mal nutrition pocket divisions" වල ), පෝෂණ මට්ටම අවම තත්වයේ සිටින දරුවන් ඉගෙනුම ලබන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කල යුතු වේ. එක් එක් දිස්ත්‍රික්ක වලින් මෙම වැඩසටහන සඳහා සම්බන්ධ කරගත හැකි උපරිම ප්‍රතිලාභීන් සංඛ්‍යාව ඇමුණුම 01 මගින් දැක්වේ.

03. 2017 වර්ෂයේ පෙබරවාරි මාසයේ සිට වලංගු වන පරිදි මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පෙර පාසල් දරුවන් සඳහා එක් ළමයෙකුට මසකට උපරිම ලෙස රු 660/= ක වටිනාකමකින් යුතුව වර්ෂයකට මාස 09 ක් සඳහා ආහාර වේල ලබාදීමට කටයුතු කරනු ලැබේ. පෙර පාසල් නිවාඩු මාසයන් වන අප්‍රේල්, අගෝස්තු හා දෙසැම්බර් මාසයන්හි මෙම වැඩසටහන ක්‍රියාත්මක නොකල යුතුය. ඒ සඳහා ගෙවීම් කරනු නොලැබේ. එසේ වෙතත් මුස්ලිම් දරුවන් ඉගෙනුම ලබන පෙර පාසල් රාමසන් උත්සවය නිමිත්තෙන් ජූලි මස වසා තබන බැවින් ඒ වෙනුවට අප්‍රේල් හෝ අගෝස්තු මස වැඩසටහන ක්‍රියාත්මක කල හැකි වේ.

**03.1** වැඩසටහන ක්‍රියාත්මක කරන මාසයන් හි සෙනසුරාදා,ඉරිදා හා රජයේ නිවාඩු දිනයන් හැර පෙර පාසල පවත්වන සියළුම දිනවල මෙම වැඩසටහන යටතේ පෙර පාසල් දරුවනට උදෑසන ආහාරවේල ලබාදිය හැකිවේ. ඒ අනුව මසකට වැඩසටහන ක්‍රියාත්මක කළ හැකි උපරිම දින ගණන 22 ක් වේ.

**03.2** උදෑසන ආහාරවේල ලබාදීමේ වැඩසටහනේ සෞඛ්‍යාරක්ෂිත බව පිළිබඳ නිරන්තරයෙන් සැලකිලිමත් විය යුතුය. මෙම නිර්දේශිත ආහාර සැලැස්ම ප්‍රාදේශිය සැපයීම හා අවශ්‍යතාවය මත සුළු වශයෙන් වෙනස් විය හැකි අතර එවැනි සංශෝධන පිළිබඳ ළමා ලේකම් කාර්යාලය දැනුවත් කළ යුතු වේ.

**<u>04. ආහාර වේල සැපයීම හා ඊට අදාල ප්‍රතිපාදන ලබාදීම</u>**

**04.1** වැඩසටහන ක්‍රියාත්මක කරන නිළධාරියාගේ තහවුරු කිරීමෙන් පසු ප්‍රාදේශිය ලේකම්ගේ අනුමැතිය යටතේ පෙර පාසල් පාලිකාව හා පෙර පාසලේ දෙමාපිය සංගමය මගින් තෝරාගත් අයෙකු හෝ කිහිපදෙනෙකු වෙත ආහාර වේල සැපයීමේ කාර්ය ඉටුකිරීමේ වගකීම ලබාදිය හැකි අතර ඇමුණුම (02) මගින් ඔවුන් පිළිබඳ තොරතුරු ප්‍රාදේශිය ලේකම් වෙත ඉදිරිපත් කර අනුමත කරවා ගත යුතු වේ. වැඩසටහනේ ප්‍රතිලාභී දරුවන් හා සැපයුම්කරුවන් පිළිබඳ තොරතුරු ඇමුණුම (04 ) පරිදි සකස් කර දිස්ත්‍රික් ලේකම්ට පිටපතක් සහිතව වැඩසටහන ආරම්භයේදී ළමා ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. මෙහිදී අඛණ්ඩව නියමිත පරිදි නිසි ප්‍රමිතියෙන් යුත් නිර්දේශිත ආහාර වේල සෞඛ්‍යාරක්ෂිතව හා පෝෂ්‍යදායීව සැපයිය හැකි කණ්ඩායම් පමණක්ම තෝරා ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

**04.2** තෝරාගත් සැපයුම්කරු/සැපයුම්කරුවන් විසින් එක් ළමයෙකුට දිනකට ග්‍රෑම් 170 කින් යුතු පිසූ ආහාරය වගුව 1 හි සඳහන් ආකාරයට සැපයිය යුතුය. එක් දරුවෙකුගේ උදෑසන ආහාරවේල සඳහා දිනකට ගෙවන මුදල රු 30/= කි.

**04.3** ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් නිරන්තරයෙන් උදෑසන ආහාරයේ සෞඛ්‍ය ආරක්ෂිත තත්ත්වය හා ගුණාත්මකභාවය පරීක්ෂාකර ප්‍රාදේශිය ලේකම් වෙත නිර්දේශ ඉදිරිපත් කල යුතුය.

**04.4** මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත මාස 03 කට වරක් අමාත්‍යාංශය විසින් නිදහස් කරන අතර, ඒ සඳහා වැඩසටහන ආරම්භයේදී මුල් ළමාවිය සංවර්ධන සහකාර (දිස්ත්‍රික් සම්බන්ධීකාරක) විසින් ප්‍රතිපාදන අවශ්‍යතාව ඇමුණුම (05 ) පරිදි සකස් කර ළමා ලේකම් කාර්යාලය වෙත දැන්විය යුතුය.ඒ අනුව උදෑසන ආහාරවේල සපයනු ලබන සැපයුම්කරුවනට ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන, දිස්ත්‍රික් ලේකම්වරුන් වෙතින් ප්‍රාදේශිය ලේකම්වරුන් විසින් ලබාගත යුතු වේ.

**04.5** ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය වෙත සපයා ඇති ප්‍රතිපාදන අවසන් වීමට පෙර ඉදිරියට අවශ්‍ය මුදල් ගණනය කර දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු වේ.එම ගණනය කිරීම් අනුව දිස්ත්‍රික් ලේකම් විසින් කාර්තු වශයෙන් අමාත්‍යාංශයෙන් අවශ්‍ය ප්‍රතිපාදන ඇමුණුම (05 ) මගින් ඉල්ලුම් කිරීමට කටයුතු කල යුතු වේ.

**05. ප්‍රතිලාභීන් තෝරා ගැනීම හා වැඩසටහන ක්‍රියාත්මක කිරීම**

**05.1** අඩු පෝෂණ මට්ටමක් සහිත පෙර පාසල් වියේ දරුවන් ඉගෙනුම ලබන පෙර පාසල් හඳුනාගැනීම ප්‍රාදේශිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල වල සහයෝගයෙන් සිදුකල යුතු වේ. එහිදී ඇමුණුම 01 හි සඳහන් ප්‍රාදේශිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයන් තුල පවතින පෙර පාසල් පමණක් පෙර පාසල් තෝරා ගැනීමට කටයුතු කල යුතු ය.

**05.2** මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ / පෙර පාසලේ සියළුම ළමුන් ප්‍රතිලාභීන් ලෙස තෝරා ගත යුතු වේ.

**05.3** මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ / පෙර පාසලේ ප්‍රධාන ගුරුතුමිය විසින් දෙමාපියන්ගේ ද එකගතාවය මත ඉගෙනුම ලබන ළමුන් සංඛ්‍යාව පදනම් කරගෙන ඇමුණුම 02 පරිදි අයදුම් පත්‍රයක් ප්‍රාදේශිය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු වේ.

**05.4** මෙම වැඩසටහනට අදාලව දිස්ත්‍රික් මට්ටමේ වගකීම හා අධීක්ෂණය දිස්ත්‍රික් ලේකම් ට පැවරෙන අතර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් වගකීම හා අධීක්ෂණය ප්‍රාදේශීය ලේකම්ට පැවරේ. දිස්ත්‍රික් මට්ටමින් මෙම වැඩසටහන සම්බන්ධීකරණය දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණය යටතේ මුල් ළමාවිය සංවර්ධන සහකාර (දිස්ත්‍රික් සම්බන්ධීකාරක) නිලධාරී විසින් සිදු කල යුතු වේ.

**05.5** මෙම අමාත්‍යාංශය විසින් ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කර ඇති මුල් ළමාවිය සංවර්ධන සහකාර/නිලධාරී වෙත වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරිය යුතු වේ. එම නිලධාරියා නොමැති ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වගකීම අමාත්‍යාංශය මගින් අනුයුක්ත කර ඇති අනෙකුත් නිලධාරීන්ගෙන් එක් අයෙකු වෙත (ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී, වනිතා සංවර්ධන නිලධාරී, සංවර්ධන සහකාර/ සංවර්ධන නිලධාරීන්, සහන සොයුරි නිලධාරී) ප්‍රාදේශිය ලේකම්ගේ අනුමැතිය පරිදි පැවරිය හැකි වේ. මෙම වැඩසටහනට අදාල ප්‍රධාන ලිපිගොනු සහ අනෙකුත් කාර්යාලීය කටයුතු වෙනුවෙන් කළමනාකරණ සහකාර නිලධාරියෙකුගේ සහාය අත්‍යවශ්‍ය බැවින් ඒ සඳහා සුදුසු නිලධාරියෙකු යෙදවීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

**06. ඇමුණුම 03 අනුව ගෙවීම් කිරීම හා ප්‍රගතිය වාර්තා කිරීම**

**06.1** උදෑසන ආහාරවේල සපයන ලද සැපයුම් කරුවන්ට ගෙවීම් කිරීම සඳහා, සම්පූර්ණ කරන ලද ඇමුණුම් 03 ආකෘති පත්‍රිකා සමග සම්පූර්ණ කරන ලද ගෙවීම් වවුචර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරවීමට වැඩසටහන ක්‍රියාත්මක කරන නිලධාරියා කටයුතු කළ යුතු වේ. අදාල ඇමුණුම් 03 පත්‍රිකාවේ පිටපතක් වැඩසටහන ක්‍රියාත්මක කරන නිලධාරියා හා පෙර පාසලේ ප්‍රධාන පාලිකාව භාරයේ තබා ගත යුතු වේ. ඒ අනුව ප්‍රාදේශිය ලේකම් විසින් සැපයුම් කරුවන්ට ගෙවීම් කිරීමට කටයුතු කරනු ඇත.

**06.2** උදෑසන ආහාරවේල ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට තෝරා ගනු ලැබූ ප්‍රතිලාභීන් පිළිබඳව වාර්තාවක් ඇමුණුම 06 අනුව මාසිකව සකසා ළමා ලේකම් කාර්යාලය වෙත එවිය යුතුය. එම වාර්තා අනුව ඔබ කොට්ඨාශයට අවශ්‍ය වන ප්‍රතිපාදන ප්‍රමාණය ගණනය කර

වෙන්කර දීමට කටයුතු කරන බැවින් ඔබ කොට්ඨාශයේ මාසික උපරිමයන් නිවැරදිව පිළියෙළ කර ඊට පෙර මාසයේ 15 වන දිනට ප්‍රථම එවීම අනිවාර්ය බව අවධාරණය කරමි. එසේ අදාල කාලසීමාවට අයත් උපරිම වාර්තාව නිවැරදි දිනයට නොඑවීමෙන් ප්‍රතිපාදන නිදහස් කිරීම දුෂ්කර වනු ඇත.

**06.3** සෑම මසකම උදෑසන ආහාරවේල සැපයීම වෙනුවෙන් සකස් කල වියදම් වාර්තාවක් දිස්ත්‍රික් ලේකම්ටද පිටපතක් ද සහිතව ඊළග මාසයේ 15 වන දිනට ප්‍රථම මෙම අමාත්‍යාංශයේ ළමා ලේකම් කාර්යාලය වෙත ඇමුණුම 07 පරිදි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් සකසා එවීම අනිවාර්ය වන අතරම ඇමුණුම 08 පරිදි සකසා දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රගතිය ළමා ලේකම් කාර්යාලය වෙත වාර්තා කිරීම අනිවාර්ය වේ. එමෙන්ම සෑම මාසයක් අවසාන වී ඉදිරි මාසයේ 03 වනදා වන විට ප්‍රගතිය ලබාදීම සඳහා දැනටමත් ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට අමාත්‍යාංශය මගින් හඳුන්වා දී ඇති ප්‍රගතිය වාර්තා කිරීමේ විද්‍යුත් ක්‍රමවේදය "e-progress system"හරහා උදෑසන ආහාරවේල ලබාදීමේ වැඩසටහන යටතේ අමාත්‍යාංශය වෙත අනියවාර්යෙන්ම ප්‍රගතිය ලබා දිය යුතු වේ.

**07.** මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන/පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාරවේල ලබාදීමේ වැඩසටහනට අදාල මෙහෙයුම් කමිටුව විසින් මෙම වැඩසටහන සම්බන්ධව ජාතික මට්ටමින් තීරණ ගනු ලබන අතර එම කමිටුවේ තීරණයන්ට යටත්ව මෙම චක්‍රලේඛය නිකුත් කරන ලදී.

**08.** දැයේ මුල් ළමාවිය දරුවන්ගේ පෝෂණ තත්වය ඉහල නැංවීම මෙම ජාතික වැඩසටහනේ මූලික අරමුණ වන අතර ඊට අමතරව දරුවන් පෙර පාසලට පැමිණීමට උනන්දුවක් ඇතිකිරීම, දෙමාපියන් විසින් දරුවන් පෙර පාසල් අධ්‍යාපනයට යොමු කිරීම ඉහල දැමීම, දිළිදු පවුල් වලට සුළු වශයෙන් හෝ ආර්ථික වාසියක් සැලසීම, සෑමට සමාන ආහාරවේලක් ලැබීම නිසා ආහාරය සංසන්දනය කිරීමට දරුවන් නොවෙහෙසීම, මුල් ළමාවිය දරුවන්ගේ පූර්ණ සංවර්ධනය හරහා රටේ මානව සම්පත් සංවර්ධනයෙහි රාජ්‍ය අංශයේ දායකත්වය පිළිබඳව ජනතාවට අවබෝධයක් ලබාදීම සෙසු අරමුණු අතර වේ.

මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ හා ඔබගේ කාර්ය මණ්ඩලය දක්වන සහයෝගය හා කැපවීම අතිශය අගය කරමි.

චන්ද්‍රානි සේනාරත්න.

ලේකම්

මුණුම

02

**<u>මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන/පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාර වේල ලබාදීමේ අයදුම් පත්‍රය - 2017</u>**

මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ / පෙර පාසලේ නම (- ..........................................................................................................

මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ $ පෙර පාසලේ ලිපිනය (- ..........................................................................................................

දිස්ත්‍රික්කය‘’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය‘’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’ ග්‍රාම නිලධාරී වසම ‘’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’

| අනු අංකය | පෙර පාසල් දරුවාගේ නම | උපන් දිනය | මව$ පියා $ භාරකරුගේ නම | උදෑසන ආහාරය ලබාදීමට කැමතියි/ අකමැතියි | මව$පියා$භාරකරුගේ අත්සන |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

ඉහත නම් සඳහන් දරුවන් ‘’’’’’’’’’’’’’’’’’’’’’ දෙනා වෙත උදෑසන ආහාරය ලබා දෙන මෙන් ඉල්ලමි.

ඒ සඳහා පහත නම් සඳහන් සැපයුම්කරුවන් එකගතාවය පළ කර ඇති බවද කාරුණිකව දන්වමි.

| | **සැපයුම්කරුගේ නම** | **ජාතික හැඳුනුම්පත් අංකය** |
|---|---|---|
| | | |
| | | |
| | | |

දිනය () ‘’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’’

.............................................................................................................

පෙර පාසලේ ප්‍රධාන  පාලිකාවගේ අත්සන (නිල මුද්‍රාව තබන්න)

**<u>තහවුරු කිරීම</u>**

තොරතුරු  නිවැරදි බව තහවුරු කර ඉදිරිපත් කරමි.

.......................................

දිනය

........................ .................... ....................................

වැඩසටහන ක්‍රියාත්මක කරන නිළධාරියාගේ අත්සන (නිල මුද්‍රාව තබන්න)

**<u>ප්‍රාදේශිය ලේකම් අනුමැතිය</u>**

මුල්  ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ **$ පෙර පාසලේ  දරුවන්** '''''''''''''''''''''   දෙනා සඳහා උදෑසන ආහාර වේල_ලබාදීම අනුමත කරමි/ නොකරමි.

දිනය () ''''''''''''''''''''''''''''''''''''''''''''

'''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''

ප්‍රාදේශිය ලේකම්ගේ අත්සන (නිල මුද්‍රාව තබන්න)

| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | | ඇමුණුම 03 |
| ආකෘති පත්‍ර අංකය ................................... | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන/පෙර පාසැල් දරුවන් සඳහා උදෑසන ආහාර වේල ලබාදීමේ වැඩසටහන - ගෙවීම් ආකෘති පත්‍රය | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| වර්ෂය :- | | | | මාසය:- | | | | | | | | ප්‍රා/ලේ කොට්ඨාශය:- | | | | | | | | | ග්‍රාම නිලධාරී වසම: | | | |
| පෙර පාසලේ ප්‍රධාන පාලිකාවගේ නම හා ලිපිනය:- | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| උදෑසන ආහාරවේල සැපයුම්කරුගේ/සැපයුම්කරුවන්ගේ නම හා ලිපිනය:- | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| පෙර පාසලේ නම හා ලිපිනය | මුළු දරුවන් ගනන | උදෑසන ආහාර වේල ලබාදුන් දින Pලකුණින් ද උදෑසන ආහාර වේල ලබානොදුන් දින « ලකුණින්ද **සලකුණු කරන්න.** | | | | | | | | | | | | | | | | | | | | | | ආහාර වේල ලබාදුන් මුළු දින ගණන |
| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 18 | 19 | 20 | 21 | 22 | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| .............................මස දින........... ක් උදෑසන ආහාරවේල සැපයූ බවට ආහාරවේල සැපයුම්කරු/සැපයුම්කරුවන්ගේ නම හා අත්සන යොදන්න. | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| .......................මස දින........... ක් ආහාරවේල පෙර පාසලේ දරුවන් සඳහා ලබාගත් බවට පෙර පාසලේ ප්‍රධාන පාලිකාවගේ නම අත්සන හා නිල මුද්‍රාව තබන්න. | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| .......................මස දින........... ක් ආහාරවේල පෙර පාසලේ දරුවන් සඳහා ලබාදුන් බවට පෙර පාසලේ දෙමාපියන් 2 කුගේ නම අත්සන යොදන්න | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 1' | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 2' | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| මාසයට ලැබිය යුතු මුළු මුදල: රු. 30 « දරුවන් ගණන « දින ගණන = රු..................................... | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| සැ: යු :-උදෑසන ආහාරවේල ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කල මාසවල මෙම ආකෘතියේ පිටපතක් වැඩසටහන ක්‍රියාත්මක කරන නිලධාරියා හා පෙර පාසලෙහි ප්‍රධාන ගුරුතුමී භාරයේ තබා ගත යුතුය. | | | | | | | | | | | | | | | | | | | | | | | | |

ඇමුණුම **04**

<u>වැඩසටහනේ ප්‍රතිලාභී දරුවන් හා සැපයුම්කරුවන් පිළිබඳ තොරතුරු</u>

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය () ''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''

වර්ෂය () ''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''

| අනු අංකය | පෙර පාසලේ නම හා ලිපිනය | ප්‍රතිලාභී දරුවන් සංඛ්‍යාව | උදෑසන ආහාරවේල සැපයුම්කරුගේ සැපයුම්කරුවන්/ ගේ නම් | උදෑසන ආහාරවේල සැපයුම්කරුගේ සැපයුම්කරුවන්ගේ / ලිපිනය | උදෑසන ආහාරවේල සැපයුම්කරුගේ සැපයුම්කරුවන්ගේ/ දුරකථන අංකය | උදෑසන ආහාරවේල සැපයුම්කරුගේ සැපයුම්කරුවන්/ ගේ ජාතික හැදුනුම්පත් අංකය |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | මුළු ප්‍රතිලාභී දරුවන් සංඛ්‍යාව | | | | | |

නිවැරදි බවට සහතික කරමි.

දිනය () ''''''''''''''''''''''''''''''''''''''''

''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''............

ප්‍රාදේශිය ලේකම්ගේ අත්සන

^නිල මුද්‍රාව තබන්න &

පිටපත: 1. දිස්ත්‍රික් ලේකම්, ........... ......................... - කා.දැ.ගැ.ස සහ අවශ්‍ය සම්බන්ධීකරණය සඳහා

**සැ.යු:- උදෑසන ආහාරවේල සැපයුම්කරු / සැපයුම්කරුවන් වෙනස්වන අවස්ථාවල එය අමාත්‍යාංශය වෙත දැන්විය යුතුය.**

ඇමුණුම 05

**වැඩසටහන සඳහා ප්‍රතිපාදන/ අමතර ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම**

දිස්ත්‍රික්කය () ''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''

වර්ෂය () ''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''

අදාල මාසයන් () ''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''

ප්‍රතිපාදන ද / අමතර ප්‍රතිපාදනද යන වග_() ''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''

| අනු අංකය | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | ප්‍රතිලාභී පෙර පාසල් සංඛ්‍යාව | ප්‍රතිලාභී දරුවන් සංඛ්‍යාව | මාසයකට අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය (.රු) | මාස03 කට අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය(.රු) | අවශ්‍ය මුළු ප්‍රතිපාදන ප්‍රමාණය (.රු ) |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | **එකතුව** | | | | | |

ඒ අනුව වැඩසටහන සඳහා මාස 03කට ප්‍රතිපාදන අවශ්‍යතාව: රු 660 * මාස 03 * දරුවන් ....................... = රු. ........................................

නිවැරදි බවට සහතික කරමි.

දිනය () ''''''''''''''''''''''''''''''''''''''''''

''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''............

දිස්තික් ලේකම්ගේ අත්සන ^නිල මුද්‍රාව තබන්න &